# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,193 - 2020 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා - 2020.09.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1290 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1293 |


*සැ. යු.-* (i) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත 2020 අගෝස්තු මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iv) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(v) මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ඔක්තෝබර් මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 සැප්තැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1287 - B 82057 — 5,403 (2020/09)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

“1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත”

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලීසියේ උපසේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (ප්‍රධාන වෛද්‍ය නිලධාරී) තනතුරට රජයේ වෛද්‍ය නිලධාරීන් ද්විතීයනය කිරීම

පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ පවත්නා ඉහත සඳහන් ප්‍රධාන වෛද්‍ය නිලධාරී තනතුරේ පුරප්පාඩුව සපුරාලීම සඳහා දැනට රාජ්‍ය සේවයේ නියුතු වෛද්‍යවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සුදුසුකම් සපුරා ඇති අයවලුන් පහතින් දක්වා ඇති ආකෘති පත්‍රය අනුව, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදසියක අයදුම්පත්‍රය පිළියෙල කොට සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාල සහතික පිටපත් ද සමඟ බහා එවනු ලබන කවරයේ වම්පස ඉහල කෙළවරෙහි '' ශ්‍රී ලංකා පොලීසියේ උපසේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (ප්‍රධාන වෛද්‍ය නිලධාරී) තනතුර '' වශයෙන් සඳහන් කර අමාත්‍යාංශ ලේකම් මගින් 2020.10.09 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, අංක 375, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ - 06 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් අයදුම්පත්‍ර කිසියම් නිලධාරියෙකු වෙත පුද්ගලිකව භාර නොදිය යුතුය.

03. සුදුසුකම් :

i. වයස.- අවුරුදු 40 ට නොඅඩු සහ 50 ට නොවැඩි විය යුතුය.

ii. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

(අ) එම්.බී.බී.එස් (ශ්‍රී ලංකා) හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලබන ඕනෑම විශ්ව විද්‍යාලයකින් ප්‍රදානය කරනු ලබන එම්.බී.බී.එස් හෝ ඒ හා සමාන වෛද්‍ය උපාධියක් සමග ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර හා පූර්ණ යථාවත් කල ලියාපදිංචියක් ලබා තිබිය යුතුය.

(ආ) පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී, පලමු ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකු විය යුතුය. වෛද්‍ය පරිපාලනය පිළිබඳ එම්.එස්.සී.උපාධිය ලබා ඇති අපේක්ෂකයන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

iii. සේවා පළපුරුද්ද :

රෝහල පරිපාලනය සම්බන්ධ මූලික රෝහලක හෝ ඊට වඩා උසස් ආයතනයක ආයතන භාර නිලධාරී වශයෙන් වසර 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

04. වැටුප් හා වෙනත් දීමනා සහ පහසුකම් :

(අ) තෝරාගන්නා ලද අයදුම්කරු / අයදුම්කාරිය හට සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් ගෙවනු ලබන ශ්‍රේණියට අදාල වැටුප හා වැටුප් වර්ධක සමග සියලු දීමනා ලබා ගැනීමට හිමිකම් ඇති අතර, එය ශ්‍රී ලංකා පොලීසිය මගින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.ඊට අමතරව ඔහුට හෝ ඇයට පොලිස් උපසේවාවේ සක්‍රිය සේවයේ යෙදෙන නිලධාරීන්ට ලැබෙන වරප්‍රසාද සඳහා හිමිකම් ඇත.

(ආ) රියදුරෙකු සමග නිල රථයක් සේවා අවශ්‍යතාවය අනුව ලැබීමට හිමිකම් ඇත.

(ඇ) රෝහල පරිශ්‍රයේ විවාහක නිළ නිවසකට හිමිකම් ලැබෙනු ඇත.

05. අයදුම්කරුවන් / අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් (මුල් පිටපත් එවිය යුතු නොවේ.) ආකෘතියට අනුව සකසා ගත් අයදුම්පත්වලට අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(iii) අමතර වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික
(iv) විශේෂ වෘත්තීය පළපුරුද්ද දැක්වෙන සහතික
(v) සේවය සනාථ කිරීමේ ලිපි

06. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

07. තෝරා ගනු ලබන අයදුම්කරු / අයදුම්කාරිය පත්වීම ලැබීමට පෙර පසුබිම් පරීක්ෂණයකින් සමත් වියයුතු අතර, පොලිස් සේවයට සුදුසු ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. නුසුදුසු වන අයදුම්කරුවන් / අයදුම්කාරියන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :

(අ) තෝරා ගන්නා ලද අයදුම්කරු / අයදුම්කාරිය ශ්‍රී ලංකා පොලිස් උපසේවාවේ නීති හා රෙගුලාසිවලට අනුකූලව උපසේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී/උපසේවා කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරෙහි නාමිකව සක්‍රීය සේවයේ පිහිටුවනු ලැබේ.

(ආ) තෝරා ගන්නා ලද අයදුම්කරු / අයදුම්කාරිය දැනට සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අයගේ එම සේවා ජ්‍යෙෂ්ඨත්වය හා වැටුප් වර්ධක නොකඩවා බලපැවැත්වෙනු ඇත.

09. සේවා කොන්දේසි ඃ

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දක්වෙන පොදු කොන්දේසිවලට බාහිර වන්නා වූ කොන්දේසි.

(අ) තෝරා ගනු ලබන අයදුම්කරු / අයදුම්කාරිය රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනට සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන චක්‍රලේඛ, නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතුය.

(ආ) තෝරා ගන්නා ලද අයදුම්කරු / අයදුම්කාරිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව සහ පොලිස්පති චක්‍රලේඛ 1693/2003 හා 1804/2004 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා /දිවුරුම් දිය යුතුය.

(ඇ) සියලුම අයදුම්කරුවන් / අයදුම්කාරියන් ආයතන සංග්‍රහයේ පළමුවන සහ දෙවන වෙළුමෙහි විධිවිධාන හා ඊට පරිබාහිරව වන්නා වූ චක්‍රලේඛ හා කොන්දේසි, පොලිස් සේවයේ නියෝග, පොලිස්පති චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි විධිවිධාන වලට යටත් වේ.

***සටහන.***-මෙම නිවේදනයෙන් දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙන අතර, එබඳු අයදුම්කරුවන් / අයදුම්කාරියන් හට මේ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.මෙහි සඳහන් පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් හට ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
වැඩබලන පොලිස්පති.

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි තනතුර**

01. අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ (මුලකුරු සමඟ) නම :————.
(i) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

02. ස්ථිර ලිපිනය :————.
ලිපි හුවමාරු ලිපිනය :————.
දුරකථන අංකය :————.
විද්‍යුත් තැපැල් ලිපිනය :————.
ස්ථිර ලිපිනයට අදාළ පොලිස් වසම :————.

03. ස්ත්‍රී / පුරුෂ භාවය :————.

04. උපන් දිනය :————.
2020.10.09 වැනි දිනට වයස ඃ අවු :————. මාස :————. දින :————.

05. සිවිල් තත්ත්වය ඃ විවාහක/අවිවාහක/ වැන්දඹු
(i) කලත්‍රයාගේ රැකියාව :————.
(ii) කලත්‍රයාගේ රැකියා ස්ථානය :————.

06. වර්තමාන සේවා තත්ත්වය ඃ
(i) දැනට දරන තනතුර :————.
(ii) දැනට දරන තනතුරේ ශ්‍රේණිය :————.
(iii) වර්තමාන සේවා ස්ථානය :————.

07. පත්වීම් ලද දිනයන් ඃ
(i) වර්තමාන තනතුරට පත් වූ දිනය :————.
(ii) මුල් පත්වීම් දිනය :————.

08. සුදුසුකම් (දිනයන් ද සහිතව සම්පූර්ණ විස්තර දක්වන්න) ඃ
 (i) අධ්‍යාපන :————.
 (ii) වෘත්තීය සුදුසුකම් :————.
 (iii) අමතර සුදුසුකම් :————.

09. දරන ලද තනතුරු ඃ

| | *තනතුර* | *සේවා ස්ථානය* | *සේවා කාලය* |
|---|---|---|---|
| (i) | .............................. | .............................. | .............................. |
| (ii) | .............................. | .............................. | .............................. |
| (iii) | .............................. | .............................. | .............................. |
| (iv) | .............................. | .............................. | .............................. |
| (v) | .............................. | .............................. | .............................. |

10. තනතුරට අදාළ වෙනත් සුදුසුකම් ඃ..............................................................................................
..............................................................................................................................

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බවට අනාවරණය වුවහොත් නුසුදුස්සෙකු බවට පත්කරනු ලැබීමට/පත්වීම ලැබීමෙන් පසු සොයාගනු ලැබුවහොත් කිසිදු වන්දි ගෙවීමකින් තොරව පොලිස් සේවයෙන් පහකරනු ලැබීමට ද, මා යටත් බව දන්වා සිටිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ
අත්සන.

දිනයඃ :————.

<u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..............................................................................මයා/මිය/මෙනවිය ..............................................................................අමාත්‍යාංශයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ ඇය තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් අදාළ නව තනතුර සඳහා මුදාහැරිය හැකි බවත්, ප්‍රකාශ කරමි.

————,
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන සහ
නිල මුද්‍රාව

දිනයඃ :————.

09-470

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

### ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
### මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත
### ආධුනිකයින් බඳවා ගැනීම - 2021 වසර

ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්වය මත ප්‍රදානය වූ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2021 වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම පිණිස වයස අවුරුදු 16 ට නොඅඩු 25 ට නොවැඩි ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **අයදුම්පත් කැඳවනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :**

| 1 | *පූර්ණ කාලීන පාඨමාලා* | *කාලය* | *බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 1.1 | මෝටර් රථ කාර්මික ශිල්පී - Automobile Mechanic | අවු. 03 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම.<br>2021.01.01 දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට අයදුම් කළ හැක. |
| 1.2 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී -Automobile Electrician | අවු. 03 | |
| 1.3 | යන්ත්‍ර ශිල්පී - Machinist | අවු. 03 | |
| 1.4 | මෝටර් රථ වායු සමීකරණ කාර්මික ශිල්පී Automobile A/C Mechanic | අවු. 02 | |
| 1.5 | මෝටර් රථ ටින්කර් ශිල්පී Automobile Tinker | අවු. 1 1/2 | රජයේ හෝ රජය විසින් පිළිගන්නා ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත් වී තිබීම.<br>2021.01.01 දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම අයදුම්කළ හැක. |
| 1.6 | මෝටර් රථ පින්තාරු ශිල්පී Automobile Painter | | |

2. **වයස :**

2021.01.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම අයදුම් කළ හැක.

3. **පාඨමාලා පුහුණු විස්තර :**

3.1 ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ) යටතේ වූ නිපුණතා පාදක පුහුණු ක්‍රමය සහ ද්විත්ව පුහුණු ක්‍රමය අනුව සියලුම පාඨමාලා පැවැත්වේ.

3.2 ඒ අනුව 1.1 සිට 1.3 දක්වා වූ පාඨමාලාවල පළමු වසරේ ආයතනික පුහුණුවේ දී ලබාගත් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ දෙවන හා තුන්වන වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.3 1.4 පාඨමාලාව සඳහා පුහුණුවේ පළමු වසර ආයතනය තුළදී න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව ලබාදෙන අතර ඉතිරි වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.4 1.5 සහ 1.6 පාඨමාලා සඳහා පුහුණුවේ පළමු මාස 06 ආයතනය තුළදී න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව ලබාදෙන අතර ඉතිරි වසර රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

3.5 1.3 පාඨමාලාවේ සී එන් සී (CNC) ප්‍රෝගැමින්, කැම් (CAM) ප්‍රෝගැමින්, ලේත් මැෂිනින් ඇතුළු මූලික යන්ත්‍රවලට අමතරව මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයට අයත් හෙඩ් ෆේසින්, බෝරිං, හෝනින්, ක්‍රෑන්ක් ග්‍රයින්ඩින් සහ ටූල් කටර් ග්‍රයින්ඩින් යන සියලුම යන්ත්‍රවල පුහුණුව ඇතුළත්ව 3.2 හි සඳහන් පරිදි පුහුණු කෙරේ.

4. **පාඨමාලා කාලය තුළ ලබාදෙන ප්‍රතිලාභ :**

4.1 සියලුම ආධුනිකයින්ට පුහුණුවේ නිරතවීමට වැඩහල් නිල ඇඳුමක් ලබාදේ.
4.2 තෝරාගනු ලබන ආර්ථික අපහසුතාවයන් ඇති ආධුනිකයින්ට ශිෂ්‍යාධාර ලබාදේ.
4.3 පාඨමාලා කාලය තුළ ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම ලබාදේ.
4.4 පුස්තකාල පහසුකම්/අධ්‍යාපන චාරිකා

5. **ආධුනිකත්ව ගිවිසුම :**

තෝරාගනු ලබන සෑම ආධුනිකයෙක් විසින්ම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය සමග ආධුනිකත්ව ගිවිසුමකට එළඹිය යුතුය. ආයතනයේ විනය නීති රීතිවලට අනුව සතුටුදායක ලෙස පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ආධුනිකත්ව ගිවිසුම අවලංගු කරනු ලැබේ.

6. **සහතිකපත් ප්‍රදානය :**
සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ජාතික වෘත්තීය සුදුසුකම් අවසාන ඇගයීම් පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින්ට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ජාත්‍යන්තරව පිළිගත් ''ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ සහතිකය'' සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහතිකයද ප්‍රදානය කරනු ලබයි.

7. **පාඨමාලා සඳහා තෝරා ගැනීම :**
බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් සපුරාලන සියලුම අයදුම්කරුවන් ගණිතය සහ සාමාන්‍ය දැනීම ඇතුළත් පැය 01ක අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර ඉන් ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවා තෝරා ගැනීම සිදුකරනු ලබයි.

8. **අයදුම්පත් එවිය යුතු ආකාරය :**
මි. මී. 290 x මි. මී. 210 (A4) ප්‍රමාණයේ කඩදාසියක පහත සඳහන් උපදෙස් හා ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පතෙහි පසුපිටෙහි මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දෙමටගොඩ මහජන බැංකු ශාඛාවේ ගිණුම් අංක **071100103320674** දරන ගිණුමට විභාග ගාස්තු ලෙස රු. **400.00** ක් බැර කර ලබාගත් ලදුපත එම අයදුම්පතේ පසු පිටෙහි පෙන්වා ඇති ස්ථානයේ අලවා **2020 ඔක්තෝබර් මස 22 දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ/විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 69/ඒ, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත,** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ ''ආධුනිකයින් බඳවා ගැනීම - 2021'' යනුවෙන් සඳහන් කළ යුතුය. අප ආයතනයට පැමිණද ඉල්ලුම්පත් නොමිලේ ලබාගත හැක. නැතහොත් අපගේ www.aeti.edu.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

**අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් :**

- අයදුම්කරුගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය ලබාදෙමින් පාඨමාලා තුනක් අයදුම්පතේ 10 වන ඡේදයේ සඳහන් කර අයදුම්කල හැකිය.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුව ලබමින් සිටින අයට අයදුම් කළ නොහැක.
- **තැපෑලේදී අස්ථානගතවන හෝ ප්‍රමාදවන අයදුම්පත්වලට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග නොකියන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතිව එවන මෙන් දන්වා සිටිනු ලැබේ.**
- වැඩිදුර තොරතුරු සඳහා ලේඛකාධිකාරී, දුරකථන අංක - 011-2572977 හෝ 011-2532182 විමසන්න.

තරංග නලීන් ගම්ලත්,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත**

*ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2021 වර්ෂය*

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

01. මුලකුරු සමග නම :

02.

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

03. සම්පූර්ණ නම :

| 04. උපන්දිනය : | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. ලිපිනය :

දුරකථන අංකය : ජංගම :

ස්ථාවර :

**(දුරකථන අංකයක් අනිවාර්යයෙන් සඳහන් කරන්න)**

07. පරිපාලන දිස්ත්‍රික්කය :

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :

08. අධ්‍යාපන සුදුසුකම් : (ලබා ඇති උසස්ම සුදුසුකම් x ලකුණ යොදන්න.)

| 8 වන ශ්‍රේණිය | | අ. පො. ස. (සා. පෙළ) | | අ. පො. ස. (උ.පෙළ) | |
|---|---|---|---|---|---|

09. අ. පො. ස. (සා.පෙළ.) විභාග ප්‍රතිඵල :

| | *සමත්වූ විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* | | *සමත් වූ විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | 8 | | | |
| 2 | | | | 9 | | | |
| 3 | | | | 10 | | | |
| 4 | | | | 11 | | | |
| 5 | | | | 12 | | | |
| 6 | | | | 13 | | | |
| 7 | | | | 14 | | | |

අ. පො. ස. (උ.පෙළ.) විභාග ප්‍රතිඵල ‍:

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | 3 | | | |
| 2 | | | | 4 | | | |

10. තෝරා ගනු ලබන පාඨමාලාවන් පිළිවෙලින් ‍:

| |
|---|
| 1 |
| 2 |
| 3 |

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුවක් මා නොලබන බවත්, මෙයින් සහතික කරන අතර, මෙහි දක්වා ඇති කරුණු අසත්‍ය බවට අනාවරණය වුවහොත්, මම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලාව හැදෑරීම සඳහා නුසුදුස්සෙකු වන බවත් හොඳාකාරව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09-273

---

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

(ISO 9001:2015 නවතම තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි)

නිපුණතා සංවර්ධන, වෘත්තීය පුහුණු, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

Sri Lanka Institute of Printing opens the door to a rewarding Carrier in Printing, Graphics, Multi Media & Packaging Industry

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2020**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයකු වන්න.

***පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ - 4 පාඨමාලාව***

***NVQ - 4 Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)***

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

*පාඨමාලා කාලය ‍: මාස 14 යි (පූර්ණ කාලීන)  මාධ්‍යය ‍: සිංහල  පාඨමාලා ගාස්තුව ‍: රු. 22,750.*

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබාදෙන අතර, පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

*කාලය ‍: මාස 04 (අර්ධ කාලීන)  මාධ්‍යය ‍: සිංහල සහ ඉංග්‍රීසි  පාඨමාලා ගාස්තුව ‍: රු. 13,250.*

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

*කාලය : මාස 05 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි*

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 17,500/- NVQ 4 සහතික පත් පාඨමාලාව රු. 23,250.

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර, ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

*කාලය : මාස 05 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 13,750.*

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

*කාලය : මාස 04 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 16,750.*

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් හා දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

*පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 20,750.*

**නවතම 2018 වර්ෂයේ නිෂ්පාදිත වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස් ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවකි.

*පාඨමාලා කාලය : වසර 03 යි (අර්ධ කාලීන)　　මාධ්‍යය : සිංහල　　පාඨමාලා ගාස්තුව : රු. 25,750*

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීම ය.

*පාඨමාලා කාලය : වසර 04 යි (අර්ධ කාලීන)　　මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 20,750.*

**ආංකික පෙර මුද්‍රණය - Digital Prepress**

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නියැළි සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබා ගත හැක.

*පාඨමාලා කාලය : වසර 01 (අර්ධ කාලීන)　　මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි　　පාඨමාලා ගාස්තුව : රු. 22,750.*

### මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Design for Print

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබා දේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

*පාඨමාලා කාලය : වසර 01 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,750.*

### පොත් බැඳීම හා නිමාකරණය - Book Binding and Finishing

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද ප්‍රයෝජනවත් වේ.

*පාඨමාලා කාලය : මාස 07 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 23,250.*

### ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design

මෙම පාඨමාලාව මගින් මුද්‍රණ ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙහි විෂයය මාලාව සකස් කර ඇති අතර, මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික් නිර්මාණකරුවකු විය හැක.

*කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,250.*

### මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology

මෙම පාඨමාලාව තුළින් ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල්වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත. මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැලි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ට ද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

*කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,750.*

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස්කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

### ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා සම්මන්ත්‍රණය

නොමිලේ සහභාගි විය හැකි ෆ්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා දැනුම සහ අවබෝධය ලබාදීමේ සම්මන්ත්‍රණයක් 2020 සැප්තැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා උදේ 8.30 සිට දහවල් 1.30 දක්වා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පැවැත්වේ. මෙම සම්මන්ත්‍රණයට ඇතුළත් විය හැක්කේ සීමාසහිත සිසුන් ප්‍රමාණයකට නිසා හැකි ඉක්මනින් පහත අංක අමතා ආසනයක් වෙන්කරවා ගන්න.

**පාඨමාලා අධ්‍යක්ෂ,**
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන අංක : 011 2686162 , 011 2679791, 0777706995
ෆැක්ස් : 011 2686162 ඊ-මේල් : sliopreg@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

*ශාඛා* :- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.
දුරකථන අංක : 066 2222172
071 0554298

09-197

## ඉඩම් අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2020 දෙසැම්බර් මාසයේ දී කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය හා ස්ථානය යථා කාලයේදී දන්වනු ලැබේ.

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු පිරවීමට හැකි වන සේ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරු 31ක් සඳහා බඳවා ගැනීමට පහත පරිදි නියමිත සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.)

| | | |
|---|---|---|
| 01 | මැනුම් විද්‍යා උපාධිධාරීන් | තනතුරු 28 |
| 02 | අනෙකුත් උපාධිධාරීන් | තනතුරු 03 |

01. *සුදුසුකම්* :

1.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින්,

(i) මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක්

හෝ

(ii) විද්‍යාවේදී විශේෂ උපාධියක් (ගණිතය හෝ භෞතික විද්‍යාව හෝ පරිගණක/තොරතුරු තාක්ෂණ විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස) හෝ

(iii) ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් හෝ

(iv) පංති සාමර්ථ්‍යයක් සහිතව පරිගණක/තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධියක් හෝ

(v) පංති සාමර්ථ්‍යයක් සහිතව ගණිතය හෝ භෞතික විද්‍යාව විෂයයන් සහිතව සාමාන්‍ය විද්‍යාවේදී උපාධියක් තිබීම.

සහ

(ආ) අ.පො.ස. උසස් පෙළ සඳහා ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් සමත්ව තිබීම.

**සටහන** : උපාධි විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින කිසිම අයකුට මෙම විභාගයට අයදුම් කිරීමට නොහැක. කෙසේ වුවද පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වූ අයකුට ඔහු / ඇය එම උපාධි විභාගය සමත් වූ බවට එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් ලබාගත් නිල ලිපියක් අයදුම්පත සමග ඉදිරිපත් කළ අවස්ථාවක දී මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

1.2 වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද : අදාළ නොවේ.

1.3 කායික සුදුසුකම් :
සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සුදුසු සෑම අයුරකින්ම ශාරීරික යෝග්‍යතාවක් ඇති ත්‍රිමාණ පෙනීම සහිත සහ වර්ණ අන්ධතාව නොමැති පුද්ගලයෙකු විය යුතුය.

1.4 *වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) යම් ආගමික නිකායක පැවිදි ධූරයක් දරන තැනැත්තන් මෙම තනතුරට බඳවා ගනු නොලබන අතර එවැනි අයට මෙම තනතුර සඳහා අයදුම් කළ නොහැක. එසේම බඳවාගැනීමේ විභාගය සඳහා පෙනී සිටීමට කිසිදු අවසරයක් නොමැත.

(iv) සේවයට පත්කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ මෙම *ගැසට්* නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය වශයෙන් සඳහන් කරන දිනට එහි සඳහන් සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීමට සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

1.5 වයස :

1.5.1 අවම වයස් සීමාව : අවුරුදු 22,

1.5.2 උපරිම වයස් සීමාව : අවුරුදු 28,
(ඒ අනුව 1998.10.12 දිනට හෝ ඊට පෙර හා 1992.10.12 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

02. *බඳවාගැනීමේ ක්‍රමය* :
විභාග කොමසාරිස් ජනරාල් විසින් පමණක් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක් මඟින් බඳවා ගනු ලැබේ. සෑම ප්‍රශ්න පත්‍රයකටම අවම වශයෙන් ලකුණු 40% ක් ලබා සියලුම විෂයයන් සමත් වූ අයදුම්කරුවන්, ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සුදුසුකම් සහ සාමාන්‍ය කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සර්වේයර් ජනරාල් විසින් පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය පිළිබඳ විස්තර :

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන්

පැවැත්වෙන අතර අයදුම්කරුවන්ට පෙනී සිටිය හැක්කේ එක් භාෂා මාධ්‍යයකින් පමණක් වන අතර විභාගය සඳහා ඉල්ලුම්කළ මාධ්‍යය පසුව වෙනස්කළ නොහැක. මෙම විභාගය පහත සඳහන් පරිදි විෂයන් තුනකට අදාළව ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වන අතර සෑම අයදුම්කරුවකුම විෂයයන් තුනටම පෙනී සිටිය යුතුය.

| | ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | අවබෝධය | පැය 2 | 100 | 40 |
| 02. | බුද්ධි පරීක්ෂණය | පැය 2 | 100 | 40 |
| 03. | සාමාන්‍ය දැනීම | පැය 2 | 100 | 40 |

**අවබෝධය** : පැය දෙක (02) ක කාල සීමාවකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍ර මගින් කෙටි පාඨ ගණනාවක් අයදුම්කරුවන් වෙත දෙනු ලැබේ. ඇතැම් පාඨ දෙනු ලබන්නේ එක් වාක්‍යයකින් අදහස ප්‍රකාශ කිරීම පිණිසය. යටින් ඉරි ඇඳි පදවලට විවරණ සැපයීමේ ප්‍රශ්න ද දෙනු ලැබේ. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අයදුම්කරුවන් වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කරන අතර, එයින් එකක් මෙම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත්ම හොඳින් ගැළපෙයි. අයදුම්කරුවයන් මෙයින් වඩාත් උචිත ප්‍රකාශය තෝරාගත යුතුය. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අයදුම්කරු වෙත ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරනු ඇත. ඒවාට නිවැරදි පිළිතුරු ලබා දීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අයදුම්කරු එම පාඨයන්ගේ අර්ථය වටහා ගන්නා ආකාරය පරීක්ෂා කිරීම සඳහාය. මෙයට අමතරව සාරාංශය ලිවීම සඳහා දිග පාඨයක් ද දෙනු ලැබේ.

**බුද්ධි පරීක්ෂණය** : පැය දෙක (2) ක කාල සීමාවකට සීමාවන මෙය සකස් කර ඇත්තේ අයදුම්කරුගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයටත්, ඔහුගේ සිතෙහි විශ්ලේෂණ හැකියාවත්, ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට ගැළපෙන ප්‍රශ්න වලින් යුක්ත වනු ඇත.

**සාමාන්‍ය දැනීම** : පැය දෙක (2) ක කාල සීමාවකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍රය ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජ, සංස්කෘතික, ආර්ථික හා පරිසරය ද ඇතුළුව සමස්ථය පිළිබඳව සහ ජාතික හා අන්තර්ජාතිකව වැදගත්වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක, තාක්ෂණික හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් ඇති දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ පොදු ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න කිහිපයකින් තමන් කැමති ප්‍රශ්න තෝරා ගැනීමට අවසර ඇත.

*සටහන* :

(අ) මෙම විභාගය සඳහා පෙනී සිටින අපේක්ෂකයන්ගේ නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි අත් අකුරු ඇති අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විභාගයේදී නුසුදුස්සන් කරනු ලැබීමට ද ඉඩ ඇත.

(ආ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් හෝ ගතවූ පසුව තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාග යේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකිවන පරිදි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදයී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ලඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත හා අයදුම්පත් තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(ඈ) මෙම නිවේදනයේ 02 ඡේදයට අනුව සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය සර්වේයර් ජනරාල්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. එයට අමතරව විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම මගින් හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.result.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීම මගින් දන්වනු ඇත.

03. *සේවා කොන්දේසි* :

(i) *වැටුප*.-මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (MN. - 5 - 2016) අනුව රු. 34,605-10 x 660-11 x 755-15 x 930 = රු. 63,460/- ක් වන අතර, පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට වැටුප් ගෙවනු ලැබේ.

(ii) තනතුරේ ස්වභාවය :
මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වන අතර, ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින්

ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. තවද ඔබ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(iii) සේවාරම්භ පුහුණුව :

(අ) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවාගනු ලබන මැනුම් විද්‍යා උපාධිධාරීන්ට දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා දෙනු ඇත.

(ආ) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවාගනු ලබන මැනුම් විද්‍යා උපාධිධාරීන් නොවන අනෙකුත් උපාධි සහිත නිලධාරීන්, ඔවුන්ගේ දෙවන උපාධිය ලෙස මැනුම් විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධි පාඨමාලාවක් මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේදී සාර්ථකව නිම කළ යුතු අතර දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් ද ලබාදෙනු ඇත.

(iv) ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන සේවයේ ස්ථිර කිරීම :

ආධුනික පුහුණුව සාර්ථකව නිමකළ, රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බඳවා ගන්නා ආධුනික මිනින්දෝරුවරුන් තනතුරේ ස්ථිර කිරීමට පෙර රාජ්‍ය භාෂාවක අදාළ ප්‍රවීණතාව ලබාගත් සහ ආධුනික මිනින්දෝරුවකු ලෙස සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන යාම සපුරා ඇති ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරෙහි සේවය කරන, 2002 අංක 17 දරන මැනුම් පනත අනුව මැනුම් සභාවේ ලියාපදිංචි මිනින්දෝරුවරයකු වන පහත සඳහන් සුදුසුකම් සපුරන නිලධාරීන්ගෙන් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම් කරනු ලැබේ.

(අ) මැනුම් විද්‍යා උපාධියක් සහිතව ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගන්නා ලද නිලධාරියකු නම්, මාස හයක (06) දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් සමඟ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරයකු ලෙස යටත් පිරිසෙයින් වසර තුනක් (03) සක්‍රිය හා සතුටුදායක ලෙස සේවය කර තිබීම.

(ආ) මැනුම් විද්‍යා නොවන වෙනත් උපාධියක් සහිතව ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගන්නා ලද නිලධාරියකු නම්, මැනුම් විද්‍යා උපාධියක් සම්පූර්ණ කිරීම හා ඉන් අනතුරුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරයකු ලෙස යටත් පිරිසෙයින් වසර තුනක් (03) සක්‍රිය හා සතුටුදායක ලෙස සේවය කිරීම.

(v) පත්වීම් ලබන්නන් විසින්, තමන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ රෝහලක වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(vi) බඳවා ගනු ලබන නිලධාරීන්ට ලබාදෙන රජයේ ගබඩා භාණ්ඩ වෙනුවෙන් රු.25,000 ක මුදල් ඇපයකට බැඳිය යුතු ය.

(vii) මැනුම් විද්‍යා උපාධියක් සහිතව ආධුනික මිනින්දෝරු-වරයකු ලෙස පත්වීම ලබන නිලධාරීන්, මිනින්දෝරුවරයකු ලෙස පත්වීම ලබන දින සිට වසර හයක (06) අනිවාර්ය සේවා කාලයකටද, වෙනත් උපාධියක් සහිතව ආධුනික මිනින්දෝරුවරයකු ලෙස පත්වීම ලබන නිලධාරීන් මිනින්දෝරුවරයකු ලෙස පත්වීම ලබන දින සිට වසර අටක (08) අනිවාර්ය සේවා කාලයකටද, යටත් වේ. ආධුනික මිනින්දෝරුවරයකු ලෙස පත්වීමක් ලබන සෑම නිලධාරියකුම සර්වේයර් ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතු අතර අනිවාර්ය සේවා කාලයට පෙර ඉවත්වන නිලධාරින් සම්බන්ධව එම ගිවිසුම ප්‍රකාර කටයුතු කළ යුතුය.

(viii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද, කලින් කළ රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද යටත් විය යුතුය.

04. සාවද්‍ය තොරතුරු සැපයීම :

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් කිරීමේදී කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. මෙම ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කරනු ලැබේ.

05. අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :

(i) මෙම ගැසට් නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් අයදුම්පත සකස් කර ගත යුතුය. අංක 01 සිට 05

දක්වා ශීර්ෂ 01 පිටුවෙහිද, ඉතිරිය අනෙක් පිටුවලටද වන සේ අයදුම්පත සැකසිය යුතුය.

(ii) අයදුම්පත සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් වන අතර, එයට අදාළ තොරතුරු තම අත් අකුරින් පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද සඳහන් කළ යුතුය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් ලබා දී ඇති පරිදිම අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා අදාළ නොවේ යනුවෙන් සටහන් කළ යුතුය.

(iii) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත ගැසට් නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක. තවද අයදුම්පතේ හිස් තීරු තැබීමෙන්ද එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බවද තරයේම සිහි තබා ගත යුතුය.

(iv) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද රාජ්‍ය සංස්ථා, මණ්ඩල, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වුවන් සිය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ ඉන් පෙර අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ. ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුවද නියමිත දිනට පසුව ලැබුනහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම සඳහා දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(v) අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිරව, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගැනීම - විවෘත තරග විභාගය - 2020**" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

(vi) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන **2020.10.12** දිනට ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් අයදුම් කළ යුතු වේ. නියමිත විභාග ගාස්තු ගෙවා **2020.10.12** දිනට හෝ එදිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කරන, නියමිත සුදුසුකම් සියල්ල සපුරාලන අයදුම්කරුවන්ට පමණක් ලිඛිත විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ.

06. අත්සන සහතික කිරීම :

දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් ඒවා සහතික කිරීමට බලයලත් අයෙකු විසින් සහතික කළ යුතුය. එනම් රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු, රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි තනතුරු වර්ගීකරණය අනුව තෘතිය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

07. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 1200 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත ගෙවා ලබාගත් රිසිට්පත, අයදුම්පතෙහි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතෙහි ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ. රිසිට්පත නොමැතිව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්පත් යොමු කිරීම :
නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2020.10.12** වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503,
කොළඹ.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාව :
විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම්, එය සර්වේයර් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇති අතර සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඒ. එල්. ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා,
සර්වේයර් ජනරාල්.

2020 සැප්තැම්බර් මස 02 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

ආදර්ශ අයදුම්පත

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020**

**Open Competitive Examination for Recruitment to the Posts of Apprentice Surveyors in the Survey Department of Sri Lanka - 2020**

☐
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඔබගේ උපාධිය : ☐
01- මැනුම් විද්‍යා
02 - වෙනත්
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා - PERERA. A. B. C.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :————.

1.4 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

1.5 2020.10.12 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

1.6 විවාහක/අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐

2.0

2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :————.

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0

ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0 දුරකතන අංක - ජංගම :

ස්ථාවර :

6.0 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

6.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

6.2 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.

7.0 අධ්‍යාපන සුදුසුකම් :

7.1 ලබා ඇති උපාධිය : (පැහැදිලිව සඳහන් කර උපාධි සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

7.1.1 උපාධිය පිළිබඳ විස්තර :

(i) උපාධිය වලංගු වන දිනය :........................................
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :........................................
(iii) විෂයයන් :........................................
........................................
........................................
(iv) පන්ති සාමර්ථ්‍යය :........................................
(v) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :........................................

7.2 අ.පො.ස. (උ. පෙළ) :

(i) විභාගය සමත් වූ වසර :..............................
(ii) විභාග අංකය :..............................
(iii) හදාරන ලද විෂය ධාරාව :...........................

| විෂයය | සාමාර්ථ්‍යය |
| --- | --- |
| | |
| | |
| | |
| | |
| | |

8.0 ඔබ කවරදක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වැරදිකරු කරනු ලැබ තිබේද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

ඔව් ☐ නැත ☐

8.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

9.0 අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයකු නම් එසේ ඉවත් වීමට හේතුව :.........................................

10.0 විභාග ගාස්තු ගෙවීම පිළිබඳ විස්තර :

10.1 විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :.........................................

10.2 ලදුපත් අංකය හා දිනය :.........................................

10.3 ගෙවූ මුදල : රු :.........................................

| මුදල් ගෙවූ ලදුපත මනා ලෙස අලවන්න. (එහි ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
| --- |

11.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .................. හා .................. වැනි දින දරන මුදල් ලදුපත මෙයට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද අයදුම්පතේ සියලු කොටස් සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කර සිටිමි.

(ඈ) මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට්* නිවේදනයේ 06 වැනි ඡේදයේ පරිදි විය යුතු ය) :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය .................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, මම සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

13.0 දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය -

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ........................................ මයා/ මිය/ මෙනෙවිය .................... දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ............... දින සිට ............. දින දක්වා ..................... වශයෙන් සේවය කරන අතර, ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/නැත. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය .................... තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වමි.

————.

දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

09-396

---

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

### අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019 (2020)**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ ආගමන හා විගමන පාලක ජනරාල් වේ. මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී තනතුරෙහි II ශ්‍රේණිය සඳහා වේ. වෙනත් ආකාරයකින් සුවිශේෂ කොට නොමැති අවස්ථාවන්හිදී "තනතුර" යන පදයෙන් අදහස් කරනුයේ බලයලත් නිලධාරී තනතුරෙහි II ශ්‍රේණිය වේ.

2. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනය 2020 ඔක්තෝබර් මස දහසය වන (16) දින වේ.

2.1. *ලිඛිත විභාගය* - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර තුන (03) කින් සමන්විත වේ.

01. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම
02. ඉංග්‍රීසි භාෂාව
03. පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම

2.2. *විභාග දිනය* - මෙම විභාගය 2020 දෙසැම්බර් මස කොළඹදී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ ආගමන හා විගමන පාලක ජනරාල්ට බලය ඇත.

2.3. සම්මුඛ පරීක්ෂණය ඃ

(i) පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10%ක් පමණක් කාන්තා අයදුම්කරුවන් සඳහා වෙන් වේ.

(ii) ආගමන හා විගමන පාලක ජනරාල් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්, ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම ලකුණු 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සේ ඉහත (i) හි දක්වා ඇති පදනමට අනුව "ඉහළම ලකුණු ලබා ගන්නා" අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. (සම්මුඛ පරීක්ෂණය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් වේ.)

(iii) සම්මුඛ පරීක්ෂණයේදී පහත අංක 6.3. යටතේ දක්වා ඇති කායික සුදුසුකම් පරීක්ෂා කරනු ඇත.

3. පත් කරනු ලබන සංඛ්‍යාව පහළොව (15) කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව අවසාන තීරණය ආගමන හා විගමන පාලක ජනරාල් විසින් ගනු ලබනු ඇති අතර, මෙම බඳවා ගැනීම් වල පත්වීම ක්‍රියාත්මක වන දිනය ද ආගමන හා විගමන පාලක ජනරාල් විසින් තීරණය කරනු ලබනු ඇත.

4. සේවා කොන්දේසි :

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධාන වලටද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති වලටද, 2013.12.20 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුර II ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ නියමයන්ට හා කොන්දේසි වලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධන වලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු තනතුරෙහි II ශ්‍රේණිය සඳහා පත් කෙරෙනු ඇත.

4.2. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එහෙත් නව පත්වීම්ලාභීන්හට පිරිනමනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.

4.3. අවුරුදු තුන (03) ක පරිවාස කාලයකට යටත්ව බලයලත් නිලධාරී තනතුරේ II ශ්‍රේණියට බඳවා ගනු ලබයි. බඳවාගනු ලැබුවකු වසර තුන (03)ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියෙහි සඳහන් කර ඇති පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර පහ (05)ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

5. *මාසික වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 34,605-10x660-11x755-15x930-රු. 63,460 (MN-5/2016) වේ. එමෙන්ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද හිමි වේ.

6. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

6.1. (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

6.2. *අධ්‍යාපන සුදුසුකම්* :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමානු ලබන උපාධියක් ලබා තිබීම;

සහ

(ii) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම.

*සටහන* - උපාධිය බලපවත්වන දිනය සහ අ. පො. ස. සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සම්මාන සාමර්ථ්‍යය ලැබූ දිනය සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනය වන 2020 ඔක්තෝබර් මස දහසය වන (16) දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

6.3. *කායික සුදුසුකම්* :

(i) අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 4 (සෙ. මී. 162.5) හා පපුවේ වට ප්‍රමාණය අඟල් 32 (සෙ. මී. 81.25) විය යුතුය.
(ii) අයදුම්කාරියන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 2 (සෙ. මී. 156) විය යුතුය.

6.4. වයස :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු විසි එක (21)ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිස් පහ (35)ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1999 ඔක්තෝබර් මස දහසය වන (16) දිනට හෝ ඊට පෙර හා 1985 ඔක්තෝබර් මස දහසය වන (16) දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

7. *විභාග ගාස්තු* :

විභාගය සඳහා වූ ගාස්තුව රු.600/- කි. එය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. මෙම විභාග ගාස්තු වලට අමතරව කිසිදු අය කිරීමක් සිදු නොකරන බවද දන්වමි. මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. (අයදුම්කරු විසින් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

8. *අයදුම් කිරීමේ ක්‍රමය* :

8.1. අයදුම්පත මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 ½ x 12 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කළ යුතුය. එම අයදුම්පත සිය අත් අකුරින් හෝ පරිගණකයෙන් හෝ යතුරු ලියනය කර හෝ සකස් කර තිබිය හැකිය. අයදුම්පත

අපේක්ෂකයා විසින් සිය අත් අකුරින් සම්පූර්ණ කර තිබිය යුතුය. අංක 1.0 සිට 2.9 තෙක් අයදුම්පත් කඩදාසියේ පළමු වැනි පිටුවේද , 2.10 සිට 7.0 තෙක් එහි දෙවන පිටුවේද, ඉතිරි කොටස් අනෙක් පිටු වලටද වන පරිද්දෙන් තම අයදුම්පත සකස් කර යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූලද යන්න පිළිබඳ විමසා බැලීම අයදුම්කරුගේ වගකීමකි. (අයදුම්කරු විසින් අයදුම්පතේ ඡායා පිටපතක් තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

8.2. අයදුම්පත අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතුය.

8.3. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත 2020 ඔක්තෝබර් මස දහසය වන (16) දින හෝ ඊට පෙර ලැබෙන සේ,

" විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.
තැ. පෙ. 1503,
කොළඹ. "

යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ බලයලත් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019 (2020) යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත පිළියෙල කිරීමේදී, මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියෙහි දක්වා ඇති පරිදි එහි ශීර්ෂයෙහි නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද යොදා පිළියෙල කර තිබීම අත්‍යවශ්‍ය වේ.

8.4. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිව්රුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු/ පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් හෝ සහතික කර තිබිය යුතුය.

8.5. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී යම් ඉල්ලුම් පත්‍රයක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට වන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.6. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් නිවේදනයක් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙක (02) ක් හෝ තුන (03) ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම්කරු විසින් තමා අයදුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීමට හැකි වනු පිණිස අයදුම්කරුගේ ෆැක්ස් අංකය ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් අදාළ පුවත්පත් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම් කිරීම වඩාත් ඵලදායී වනු ඇත. තවද, විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්කරු ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානම්ව තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

9. *විභාගයට ඇතුළුවීම* :

9.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබ ඇති අයදුම්කරුවන් සඳහා පමණක් විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. විභාග දින එම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකු හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2. අපේක්ෂකයන් විසින් තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර සෑම අපේක්ෂකයකුම තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය එම විභාග ශාලාවේදී පළමුවෙන්ම පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත.

**සටහන.**- විභාග අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, එම අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වීම සඳහා හෝ තනතුරක් දැරීම සඳහා හෝ මෙම නිවේදනය මඟින් ඉල්ලා ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. **අපේක්ෂකයාගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*

අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු හට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවකදී එම අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත.

12. අවශ්‍ය අවස්ථාවකදී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව ආගමන හා විගමන පාලක ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. *විභාගය පැවැත්වීම :*

13.1. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

13.2. අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් උපාධිය ලබා ගත් භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

13.3. අපේක්ෂකයකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

13.4. ප්‍රධාන විෂය එක් භාෂාවකිනුත් අතිරේක විෂය තවත් භාෂාවකිනුත් සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

**සටහන :**

(i) ඉහත 13.2 සහ 13.3 හි ඇති සුදුසකම් ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6.2. හි (i) ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.

(ii) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින ඉංග්‍රීසි විෂයය ප්‍රශ්න පත්‍රය හැර, බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම සහ පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම යන ප්‍රශ්න පත්‍ර දෙකට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) තම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

14. *බඳවා ගැනීමේ ක්‍රමය :*

14.1. ලිඛිත විභාගය-

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුන (03)කින් යුත් ලිඛිත විභාගයක් පවත්වනු ලබයි. අපේක්ෂකයන් විසින් විභාගයේ සියලුම විෂයයන් සඳහා පෙනී සිටිය යුතුය. එම විෂයයන් සහ එක් එක් විෂයය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| විෂය අංකය | විෂයය | ලකුණු ප්‍රමාණය | සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය | කාලය පැය |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම | 100 | 40 | 2 |
| 02 | ඉංග්‍රීසි භාෂාව | 100 | 40 | 2 |
| 03 | පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම | 100 | 40 | 1 |

14.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය-

(i) ඉහත අංක 6 යටතේ දක්වා ඇති බඳවා ගැනීම් සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබයි. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබයි.

(ii) එක් එක් විෂයය සඳහා අවම ලකුණු හතළිහක් (40%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් අතරින් සියලු විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. එසේ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින්, ලිඛිත විභාගයෙන් ඔවුන් විසින් ලබා ගත් කුසලතා අනුපිළිවෙළ හා බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබයි. බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවට සමාන සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති වුව හොත් එවැනි

අවස්ථාවන්හිදී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

***සැලකිය යුතුයි*** .- සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගි වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3. පුරප්පාඩු සංඛ්‍යාව අනුව, සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණු සංඛ්‍යාව මත ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් මෙම තනතුරට බඳවා ගනු ලැබේ.

14.4. ප්‍රතිඵල :

මෙම *ගැසට්* නිවේදනයේ 14.1 ඡේදය මඟින් දක්වා ඇති පරිදි, අපේක්ෂකයන් විභාගයේදී ලබා ගන්නා මුළු ලකුණු කුසලතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ආගමන හා විගමන පාලක ජනරාල් වෙත ලබා දෙනු ඇත. විභාග යට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම හෝ සිදු කරනු ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

15. ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

01. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම - කාලය පැය 02යි. ලකුණු 100යි.

1 වන කොටස - බුද්ධි පරීක්ෂණය
අපේක්ෂකයන්ගේ තර්කන ශක්තිය, ගණිතමය දක්ෂතා, අවබෝධය හා තීරණ ගැනීමේ හැකියාව මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

2 වන කොටස - සාමාන්‍ය දැනීම
මෑත භාගයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික, සාමාජීය හා දේශපාලන තොරතුරු, ලෝක දේශපාලනය, විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රවල දැනීම හා නව විද්‍යාත්මක සොයා ගැනීම් ආදිය පිළිබඳ අරමුණු කරන ලද කෙටි හා / හෝ බහුවරණ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

02. ඉංග්‍රීසි භාෂාව - කාලය පැය 02 යි. ලකුණු 100 යි. කියවීමෙන් අවබෝධය, ප්‍රකාශන හා සන්නිවේදන හැකියාව මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

03. පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම, කාලය පැය 01 යි. ලකුණු 100 යි.

පරිගණක පිළිබඳ මූලික දැනීම, MS Word, MS Excel, වැනි මෘදුකාංග භාවිතය පිළිබඳව සහ Internet, e-mail භාවිතය පිළිබඳ දැනුම මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් හෝ නොගැලපීමක් වේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කළ යුතුය.

යූ. වී. සරත් රූපසිරි,
ආගමන හා විගමන පාලක ජනරාල්,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

2020 අගෝස්තු මස 24 වැනි දින,
සුහුරුපාය,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**බලයලත් නිලධාරි තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2019 (2020)**

**Open Competitive Examination for Recruitment to grade II of the Post of Authorized Officer - 2019(2020)**

1. මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න) :

| *විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය* | අංකය |
|---|---|
| සිංහල | 2 |
| දෙමළ | 3 |
| ඉංග්‍රීසි | 4 |

(අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.)

2. පෞද්ගලික තොරතුරු :

2.1. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදාහරණ. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2. අගට යෙදෙන නම මුලින්ද, අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්). :————.
(උදාහරණ. GUNAWARDHANA H. M. S. K. )

2.3. සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————————————————.

2.4. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————————————————.

2.5. ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය

i. ………………………………………………………………………………….
………………………………………………………………………………….
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

ii. ………………………………………………………………………………….
………………………………………………………………………………….
(සිංහලෙන්/ දෙමළෙන්)

2.6. ස්ත්‍රී/ පුරුෂ භාවය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| | | |
|---|---|---|
| පුරුෂ | - | 0 |
| ස්ත්‍රී | - | 1 |

2.7. ජන වර්ගය : ( අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| | | |
|---|---|---|
| සිංහල | - | 1 |
| දෙමළ | - | 2 |
| ඉන්දියානු දෙමළ | - | 3 |
| මුස්ලිම් | - | 4 |
| වෙනත් | - | 5 |

2.8. ජාතික හැඳුනුම්පත් අංකය :

2.9. ජංගම දුරකතන අංකය :

2.10. උපන් දිනය :

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

2.11. සුදුසුකම් සැපිරිය යුතු 2020 ඔක්තෝබර් මස දහසය වන (16) දිනට වයස :

| අවුරුදු | මාස | දින |
|---|---|---|
| | | |

3. අධ්‍යාපන සුදුසුකම් :

3.1. උපාධි සුදුසුකම :

(i) උපාධිය ලද දිනය :————.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :————.
(iii) ලියාපදිංචි අංකය :————.

(iv) බාහිර/ අභ්‍යන්තර යන වග :————.
(v) උපාධිය :————.
(vi) විෂයයන්/ විෂය ක්ෂේත්‍රය :————.
(vii) විභාග අංකය :————.
(viii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍ය :————.

3.2. අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය :
(i) සමත් වූ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍ය :————.
(iv) ඉංග්‍රීසි විෂයයට ලද සාමාර්ථය :————.

4. කායික සුදුසුකම් :
4.1. උස
අඩි ............... අඟල්............... හෝ සෙන්ටිමීටර ...............
4.2. පපුවේ වට ප්‍රමාණය (කාන්තා අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)
අඩි ............... අඟල් ............... හෝ සෙන්ටිමීටර ...............

5.
5.1. කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණය මඟින් ඔබ වරදකරු කර තිබේද?
............... (ඔව්/ නැත)
5.2. පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ තොරතුරු සඳහන් කරන්න.
..................................................................................................
..................................................................................................

6.
6.1. ඔබ දැනට රජයේ සේවයේ තනතුරක් දරනු ලබන්නේ ද යන්න. ............... (ඔව්/ නැත)
6.2. පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ තොරතුරු සඳහන් කරන්න. ...........................
..................................................................................................
..................................................................................................

7. ඔබ රජයේ සේවයේ තනතුරක් දරා ඉන් පහ කරනු ලැබූ/ ඉවත් වූ අයෙකුද යන්න. ..............................

8. විභාග ගාස්තු
I. ගෙවන ලද තැපැල්/ උප තැපැල් කාර්යාලය :————.
II. ගෙවූ මුදල :————.
III. ගෙවූ දිනය :————.
IV. ලදුපත් අංකය :————.

ලදුපත එහි දරයකින් නොගැලවෙන පරිදි මෙහි අලවන්න.
(ලදු පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

9. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙහි සඳහන් කර ඇති සියලුම කරුණු මාගේ දැනීමට හා විශ්වාසයට අනුව සත්‍ය බවට සහතික වෙමි. තවද විභාග නීති රීති අනුව ක්‍රියා කිරීමටද, මෙම විභාගය පිළිබඳ විධිවිධාන හා කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයකටද මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම. ( ගැසට් නිවේදනයේ 8.4. ඡේදය පරිදි විය යුතුය.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ ....................................................................(සම්පූර්ණ නම) මහතා/මිය/ මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බවත් , ඔහු/ ඇය 2020. ............................ වැනි දින මා ඉදිරිපිටදී මෙම අයදුම්පතේ අත්සන් තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවූ ලදු පත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තැබිය යුතුය)

09-469/2

---

**අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019 (2020)

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ ආගමන හා විගමන පාලක ජනරාල් වේ. මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී තනතුරෙහි II ශ්‍රේණිය සඳහා වේ. වෙනත් ආකාරයකින් සුවිශේෂ කොට නොමැති අවස්ථාවන්හිදී "තනතුර" යන පදයෙන් අදහස් කරනුයේ බලයලත් නිලධාරී තනතුරෙහි II ශ්‍රේණිය වේ.

2. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනය 2020 ඔක්තෝබර් මස දහසය වන (16) දින වේ.

2.1. ලිඛිත විභාගය - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර තුන (03) කින් සමන්විත වේ.

01. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම
02. ඉංග්‍රීසි භාෂාව
03. පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම

2.2. විභාග දිනය - මෙම විභාගය 2020 දෙසැම්බර් මස කොළඹදී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ ආගමන හා විගමන පාලක ජනරාල්ට බලය ඇත.

2.3. *සම්මුඛ පරීක්ෂණය* :

(i) පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10%ක් පමණක් කාන්තා අයදුම්කරුවන් සඳහා වෙන් වේ.

(ii) ආගමන හා විගමන පාලක ජනරාල් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්, ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම ලකුණු 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සේ ඉහත (i) හි දක්වා ඇති පදනමට අනුව "ඉහළම ලකුණු ලබා ගන්නා" අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. (සම්මුඛ පරීක්ෂණය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් වේ.)

(iii) සම්මුඛ පරීක්ෂණයේදී පහත අංක 6.3. යටතේ දක්වා ඇති කායික සුදුසුකම් පරීක්ෂා කරනු ඇත.

3. පත් කරනු ලබන සංඛ්‍යාව පනහ (50) කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව අවසාන තීරණය ආගමන හා විගමන පාලක ජනරාල් විසින් ගනු ලබනු ඇති අතර, මෙම බඳවා ගැනීම්වල පත්වීම ක්‍රියාත්මක වන දිනය ද ආගමන හා විගමන පාලක ජනරාල් විසින් තීරණය කරනු ලබනු ඇත.

4. *සේවා කොන්දේසි* :

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද, 2013.12.20 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුර II ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ නියමයන්ට හා කොන්දේසි වලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධන වලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු තනතුරෙහි II ශ්‍රේණිය සඳහා පත් කෙරෙනු ඇත.

4.2. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.

4.3. එක් (01) අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව බලයලත් නිලධාරී තනතුරේ II ශ්‍රේණියට බඳවා ගනු ලබයි. බඳවාගනු ලැබූවකු වසර තුන (03)ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියෙහි සඳහන් කර ඇති පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර පහ (05)ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

5. *මාසික වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 34,605-10X660-11X755-15X930-රු. 63,460(MN-5/2016) වේ. එමෙන්ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

6. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

6.1. (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම,
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම,
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

6.2. *අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද* :

(i) අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය, ඉංග්‍රීසි, සිංහල/ දෙමළ භාෂාව යන විෂයයන් ඇතුළුව අවම වශයෙන් විෂයයන් හතර (04) කට සම්මාන සාමර්ථ්‍යය සහිතව එක් වරකදී විෂයයන් හයක් (06) සමත්වී තිබීම;

*සහ*

අ. පො. ස. උසස්පෙළ විභාගයේදී අවම වශයෙන් එක් (01) විෂයයක් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම;

*සහ*

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනට රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN -1/2016 හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර දහය (10) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

සහ

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනට රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN -1/2016 හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර පහ (05) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සටහන :

(i) උපාධිය බලපවත්වන දිනය සහ අ. පො. ස. සාමාන්‍ය පෙළ/ උසස්පෙළ විභාග වලින් ඉහතින් අපේක්ෂිත සාමර්ථ්‍යය ලැබූ දිනයන් සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනය වන **2020 ඔක්තෝබර් මස දහසය වන (16)** දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

(ii) ඉහත සඳහන් සේවා කාලය ගණනය කිරීමේදී රාජ්‍ය සේවය සහ/ හෝ පළාත් රාජ්‍ය සේවයන්හි අදාළ හා අඛණ්ඩ සේවා කාලයන් පිළිගනු ලැබේ.

6.3. *කායික සුදුසුකම්* :

(i) අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 4 (සෙ. මී. 162.5) හා පපුවේ වට ප්‍රමාණය අඟල් 32 (සෙ. මී. 81.25) විය යුතුය.
(ii) අයදුම්කාරිණියන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 2 (සෙ. මී. 156) විය යුතුය.

6.4 *වයස* :
රාජ්‍ය සේවයෙහි දැනටමත් සේවයේ නියුතු නිලධාරීන් සඳහා වන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

7. *විභාග ගාස්තු* :

විභාගය සඳහා වූ ගාස්තුව රු.600/- කි. එය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිඳු අය කිරීමක් සිදු නොකරන බවද දන්වමි. මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. (අයදුම්කරු විසින් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

8. *අයදුම් කිරීමේ ක්‍රමය* :

8.1. අයදුම්පත මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 ½ X12 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කළ යුතුය. එම අයදුම්පත සිය අත් අකුරින් හෝ පරිගණකයෙන් හෝ යතුරු ලියනය කර හෝ සකස් කර තිබිය හැකිය. අයදුම්පත අපේක්ෂකයා විසින් සිය අත් අකුරින් සම්පූර්ණ කර තිබිය යුතුය. අංක 1.0 සිට 2.9 තෙක් අයදුම්පත් කඩදාසියේ පළමු වැනි පිටුවේ ද , 2.10 සිට 5.2 තෙක් එහි දෙවන පිටුවේ ද, ඉතිරි කොටස් අනෙක් පිටු වලටද වන පරිද්දෙන් තම අයදුම්පත සකස් කර යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූලද යන්න පිළිබඳ විමසා බැලීම අයදුම්කරුගේ වගකීමකි. (අයදුම්කරු විසින් අයදුම්පතේ ඡායා පිටපතක් තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

8.2. අයදුම්පත අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතුය.

8.3. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මඟින් **2020 ඔක්තෝබර් මස දහසය වන (16) දින** හෝ ඊට පෙර ලැබෙන සේ

" විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.
තැ. පෙ. 1503,
කොළඹ. "

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ බලයලත් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019 (2020) යනුවෙන් පැහැදිළිව සඳහන් කර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත පිළියෙල කිරීමේදී, මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියෙහි දක්වා ඇති පරිදි එහි ශීර්ෂයෙහි නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද යොදා පිළියෙල කර තිබීම අත්‍යවශ්‍ය වේ.

8.4. විභාගය සඳහා ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුගේ තනතුර හා සේවා ස්ථානය විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් සිදු වන වෙනස්කම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

8.5. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/ පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් හෝ සහතික කර තිබිය යුතුය.

8.6. සෑම ආකාරයකින් ම සම්පූර්ණ වී නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී යම් ඉල්ලුම් පත්‍රයක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට වන කිසිඳු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.7. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් නිවේදනයක් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙක (02) ක් හෝ තුන (03) ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම්කරු විසින් තමා අයදුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීමට හැකි වනු පිණිස අයදුම්කරුගේ ෆැක්ස් අංකය ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක් අදාළ පුවත් පත් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසීම් කිරීම වඩාත් ඵලදායී වනු ඇත. තවද, විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම්

තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්කරු ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සුදානම්ව තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

9. *විභාගයට ඇතුළුවීම* :

9.1. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබ ඇති අයදුම්කරුවන් සඳහා පමණක් විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. විභාග දින එම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකු හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2. අපේක්ෂකයන් විසින් තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර සෑම අපේක්ෂකයකුම තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය එම විභාග ශාලාවේදී පළමුවෙන්ම පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්පත්‍රය* ආරම්භයේ පළ කර ඇත.

***සටහන***.- විභාග අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, එම අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වීම සඳහා හෝ තනතුරක් දැරීම සඳහා හෝ මෙම නිවේදනය මඟින් ඉල්ලා ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* :

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු හට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාග යෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවකදී එම අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත.

12. අවශ්‍ය අවස්ථාවකදී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව ආගමන හා විගමන පාලක ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. *විභාගය පැවැත්වීම* :

13.1. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

13.2. අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

13.3. අපේක්ෂකයකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

13.4. ප්‍රධාන විෂය එක් භාෂාවකිනුත් අතිරේක විෂය තවත් භාෂාවකිනුත් සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමර්ථ්‍යය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

**සටහන**

(i) ඉහත 13.3 හි ඇති "සුදුසුකම් ලත් උපාධිය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6.2. හි (ii) ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.

(ii) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින ඉංග්‍රීසි විෂයය ප්‍රශ්න පත්‍රය හැර, බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම සහ පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම යන ප්‍රශ්න පත්‍ර දෙකට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) තම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

14. *බඳවා ගැනීම් ක්‍රමය* :

14.1. ලිඛිත විභාගය

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුන (03)කින් යුත් ලිඛිත විභාගයක් පවත්වනු ලබයි. අපේක්ෂකයන් විසින් විභාගයේ සියලුම විෂයයන් සඳහා පෙනී සිටිය යුතුය. එම විෂයයන් සහ එක් එක් විෂයය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| විෂය අංකය | විෂයය | ලකුණු ප්‍රමාණය | සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය | කාලය පැය |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම | 100 | 40 | 2 |
| 02 | ඉංග්‍රීසි භාෂාව | 100 | 40 | 2 |
| 03 | පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම | 100 | 40 | 1 |

14.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

(i) ඉහත අංක 6 යටතේ දක්වා ඇති බඳවා ගැනීම් සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබයි. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබයි.

(ii) එක් එක් විෂයය සඳහා අවම ලකුණු හතළිහක් (40%) හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් අතරින් සියලු විෂයයන්ට ලැබූ ලකුණු වල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. එසේ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින්, ලිඛිත විභාගයෙන් ඔවුන් විසින් ලබා ගත් කුසලතා අනුපිළිවෙළ හා බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබයි. බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවට සමාන සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති වුව හොත් එවැනි අවස්ථාවන්හිදී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

***සැලකිය යුතුයි.*** - සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගි වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3. පුරප්පාඩු සංඛ්‍යාව අනුව, සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණු සංඛ්‍යාව මත "ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින්" මෙම තනතුරට බඳවා ගනු ලැබේ.

14.4 *ප්‍රතිඵල* :

මෙම *ගැසට්* නිවේදනයේ 14.1 ඡේදය මඟින් දක්වා ඇති පරිදි, අපේක්ෂකයන් විභාගයේදී ලබා ගන්නා මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ආගමන හා විගමන පාලක ජනරාල් වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම හෝ සිදු කරනු ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

15. *ලිඛිත විභාගයේ විෂය නිර්දේශය* :

01. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම - කාලය පැය 02යි. ලකුණු 100යි.

1 වන කොටස - බුද්ධි පරීක්ෂණය

අපේක්ෂකයන්ගේ තර්කන ශක්තිය, ගණිතමය දක්ෂතා, අවබෝධය හා තීරණ ගැනීමේ හැකියාව මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

2 වන කොටස - සාමාන්‍ය දැනීම

මෑත භාගයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික, සාමාජීය හා දේශපාලන තොරතුරු, ලෝක දේශපාලනය, විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍ර වල දැනීම හා නව විද්‍යාත්මක සොයා ගැනීම් ආදිය පිළිබඳ අරමුණු කරන ලද කෙටි හා / හෝ බහුවරණ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

02. ඉංග්‍රීසි භාෂාව - කාලය පැය 02 යි. ලකුණු 100 යි. කියවීමෙන් අවබෝධය, ප්‍රකාශන හා සන්නිවේදන හැකියාව මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

03. පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම, කාලය පැය 01 යි. ලකුණු 100 යි.
පරිගණක පිළිබඳ මූලික දැනීම, MS Word, MS Excel, වැනි මෘදුකාංග භාවිතය පිළිබඳව සහ Internet, e-mail භාවිතය පිළිබඳ දැනුම මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් හෝ නොගැළපීමක් වේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කළ යුතුය.

යූ. වී. සරත් රූපසිරි,
ආගමන හා විගමන පාලක ජනරාල්,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

2020 අගෝස්තු මස 24 වැනි දින
සුහුරුපාය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

| |
|---|
| |

<u>කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා</u>

බලයලත් නිලධාරි තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019 (2020)
Limited Competitive Examination for Recruitment to grade II of the Post of Authorized Officer - 2019(2020)

1. මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න) :

| *විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය* | *අංකය* |
|---|---|
| සිංහල | 2 |
| දෙමළ | 3 |
| ඉංග්‍රීසි | 4 |

(අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.)

2. පෞද්ගලික තොරතුරු :

2.1. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*උදාහරණ* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2. අගට යෙදෙන නම මුලින්ද, අනෙකුත් නම් වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්). :————.
(*උදාහරණ* : GUNAWARDHANA H. M. S. K. )

2.3. සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————————————————————.

2.4. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————————————————————.

2.5. ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය

(i) ..................................................................................................
..................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ii) ..................................................................................................
..................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

2.6. ස්ත්‍රී/ පුරුෂ භාවය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| | | |
|---|---|---|
| පුරුෂ | - | 0 |
| ස්ත්‍රී | - | 1 |

2.7. ජන වර්ගය : ( අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| | | |
|---|---|---|
| සිංහල | - | 1 |
| දෙමළ | - | 2 |
| ඉන්දියානු දෙමළ | - | 3 |
| මුස්ලිම් | - | 4 |
| වෙනත් | - | 5 |

2.8. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.9. ජංගම දුරකතන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

2.10. උපන් දිනය :

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

2.11. සුදුසුකම් සැපිරිය යුතු 2020 ඔක්තෝබර් මස දහසය වන (16) දිනට වයස :

| අවුරුදු | මාස | දින |
|---|---|---|
| | | |

3. 3.1 ඔබ 2020 ඔක්තෝබර් මස දහසය වන (16) දිනට සිටින සේවාවට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න. :————.

3.2 ඔබ ගැසට් නිවේදනයේ 6 ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබේ ද? :————.

3.3 ඔබ සුදුසුකම් ලබන්නේ එහි කුමන අංකය යටතේ ද යන්න :————.
(6.2 හි (i) යටතේ/6.2 හි (ii) යටතේ)

4. අධ්‍යාපන සුදුසුකම් :

4.1. උපාධි සුදුසුකම :

(i) උපාධිය ලද දිනය :————.
(ii) විශ්වවිද්‍යාලය/ ආයතනය :————.
(iii) ලියාපදිංචි අංකය :————.
(iv) බාහිර/ අභ්‍යන්තර යන වග :————.
(v) උපාධිය :————.
(vi) විෂයයන්/ විෂය ක්ෂේත්‍රය :————.
(vii) විභාග අංකය :————.
(viii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍ය :————.

4.2. අ. පො. ස. උසස් පෙළ විභාගය :

(i) සමත් වූ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍ය :————.
(iv) සාමාර්ථය :
1. :————. 2. :————.
3. :————. 4. :————.

4.3. අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය :

(i) සමත් වූ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍ය :————.
(iv) සාමාර්ථය :
1. :————. 2. :————.
3. :————. 4. :————.
5. :————. 6. :————.
7. :————. 8. :————.
9. :————. 10. :————.

5. කායික සුදුසුකම් :

5.1. උස :

අඩි .............. අඟල්.............. හෝ සෙන්ටිමීටර ..............

5.2. පපුවේ වට ප්‍රමාණය (කාන්තා අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)
අඩි ............... අඟල් ............... හෝ සෙන්ටිමීටර ...............

6. සේවා පළපුරුද්ද :

6.1 දැනට දරන තනතුර :..............................
6.2 ශ්‍රේණිය :..............................
6.3 තනතුරට පත් වූ දිනය :..............................
6.4 තනතුරෙහි ස්ථිර කළ දිනය :..............................
6.5 වැටුප් කේත අංකය හා පරිමාණය :..............................
6.6 තනතුර අයත් වන්නේ මධ්‍යම රජයටද/පළාත් රාජ්‍ය සේවයටද යන්න :..............................
6.7 අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සක්‍රිය සේවා කාලයන් කිහිපයක් අදළ වේ නම් ඒ පිළිබඳ විස්තර

| | *සේවය/තනතුර හා ශ්‍රේණිය* | *වැටුප් කේත අංකය* | *පත් වූ දිනය* |
|---|---|---|---|
| (i) | ..................... | ..................... | ..................... |
| (ii) | ..................... | ..................... | ..................... |
| (iii) | ..................... | ..................... | ..................... |
| (iv) | ..................... | ..................... | ..................... |

6.8. මෙම ගැසට් නිවේදනයේ 6.2 හි සඳහන් කොන්දේසි ප්‍රකාරව 2020 ඔක්තෝබර් මස දහසය වන (16) දිනට අනුමත තනතුරක හෝ තනතුරුවල සේවයේ නියුතු සම්පූර්ණ සේවා කාලය :————.

7. විභාග ගාස්තු :

I. ගෙවන ලද තැපැල්/ උප තැපැල් කාර්යාලය :————.
II. ගෙවූ මුදල :————.
III. ගෙවූ දිනය :————.
IV. ලදුපත් අංකය :————.

ලදුපත එහි දාරයකින් නොගැලවෙන පරිදි මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

8. අයදුම්කරුගේ ප්‍රකාශය :

අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට ගැසට් නිවේදනයේ 6 ඡේදයට අනුව සපුරාලිය යුතු සියලු සුදුසුකම් මා විසින් සපුරා ඇති බවත්, කිසියම් ආකාරයක විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) ලක් වී නොමැති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

ගැසට් නිවේදනයේ සඳහන් සියලුම නීතිරීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරඟ විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු වන බවටද, මෙහි සඳහන් කර ඇති සියලුම කරුණු මාගේ දැනීමට හා විශ්වාසයට අනුව සත්‍ය බවටද සහතික වෙමි. තවද විභාග නීති රීති අනුව ක්‍රියා කිරීමටද, මෙම විභාගය පිළිබඳව කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයකටද මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ............................................. (සම්පූර්ණ නම) මහතා/මිය/ මෙනවිය, මධ්‍යම රජය/ පළාත් සභාව යටතේ වන .............................. අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ........................... තනතුරක සේවය කරනු ලබන බවත්, ඔහු/ ඇය විසින් *ගැසට්* නිවේදනයේ අංක 6 ඡේදයට අනුව සුදුසුකම් සපුරාලිය යුතු අවසන් දිනට වසර ............... (පහක/ දහයක) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්, කිසියම් ආකාරයක විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) ලක් වී නොමැති බවත්, *ගැසට්* නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ ඇය මෙම විභාගයට පෙනී සිටීම සඳහා සපුරාලිය යුතු සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, ඔහු/ ඇය 2020 ............................ වැනි දින මා ඉදිරිපිට දී මෙම අයදුම්පතේ අත්සන් තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවූ ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාව තැබිය යුතුය)

09-469/1

---

**අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

ග්‍රාම නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020

අංක 2187 දරන 2020 ජූලි මස 31 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ග්‍රාම නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 විභාග නිවේදනයේ පළමු ඡේදයේ තෙවන වගන්තිය, 9 ඡේදයේ අයදුම්පත් කැඳවන අවසාන දිනය පහත පරිදි සංශෝධනය කෙරේ.

i. පළමු ඡේදයේ තෙවන වගන්තිය පමණක් පහත පරිදි සංශෝධනය වේ.
   - එමගින් 2020 දෙසැම්බර් මාසයේ දී පවත්වනු ලබන බවත් ඒ සඳහා අයදුම්පත් කැඳවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ii. 9 ඡේදයේ අයදුම්පත් කැඳවන අවසාන දිනය 2020.09.30 දක්වා දීර්ඝ කරනු ලැබේ. ඒ අනුව අයදුම්කරුවන් 2020.09.30 දින වන විට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

iii. මෙම විභාගය සඳහා මේ වන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් එවීමෙන් වලකින ලෙස ද දනුම් දෙනු ලැබේ.

කමල් ගුණරත්න, ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරල් (විශ්‍රාමික)
ලේකම්,
අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 01 වැනි දින,
අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු
හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය,
''නිල මැදුර'',
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

09-498

සංශෝධනයයි

**අධ්‍යාපන අමාත්‍යාංශය**

2018 අ.පො.ස. (උ/පෙළ) ප්‍රතිඵල මත 2020 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවා ගැනීමට අදාළ ව 2020.09.04 දින පළවූ 09-144 නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතුය. :-

පාඨමාලා අංකය 49 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (සිංහල)
50 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (දෙමළ)

4.28

4.28.1 2018 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ගිණුම්කරණය, ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව යන වාණිජ්‍ය විෂය ධාරාවට අයත් විෂයයන් තුන (03) හෝ එයින් විෂයයන් 02ක් සමඟ තුන්වන විෂයය වශයෙන් පහත සඳහන් කර ඇති එක් විෂයයක් සමඟ විෂයයන් තුනකින් (03) හෝ එකවර සමත් වීම;

- ව්‍යාපාර සංඛ්‍යානය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, ඉතිහාසය, තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය, ඉංග්‍රීසි, ජර්මන්, ප්‍රංශ, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හෝ ගණිතය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, භෞතික විද්‍යාව;

හා

4.28.2 3.0 හි 3.3.1 ට අදාළ සුදුසුකම් සහිත ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය හෝ ව්‍යවසායකත්ව අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් සහිත ව සමත් වීම.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 07 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය'
බත්තරමුල්ල.

09-517

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.